# 2025 ජුනි මාසයට අදාලව 2025.06.06 වන දින පවත්වන ලද බිබිල ප්‍රාදේශීය සභාවේ මංගල සභා රැස්වීමේ වාර්තාව.

**දිනය** - 2025.06.06
**වේලාව** - ප.ව. 12.30
**ස්ථානය** - බිබිල ප්‍රාදේශීය සභාවේ සභා රැස්වීම් ශාලාව.
**සහභාගිත්වය** -

| | | |
|---|---|---|
| 01. වී.සරත් විදානගම මැතිතුමා | - | ගරු සභාපති |
| 02. එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා | - | ගරු උප සභාපති |
| 03. ඩබ්.එම්. රූපසේන මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 04. බී.එම්. වීරසේකර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 05. ආර්.බී. ප්‍රේමතිලක මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 06. ඩී.එම්. ශ්‍රියානි මංගලිකා ජයලත් මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 07. ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 08. පී.ජයන්ති මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 09. ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 10. ඒ.එම්. ධම්මික බණ්ඩාර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 11. පී.කේ.ඩී. රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 12. එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 13. කේ.ජී. උදය සඳරුවන් ජයසිංහ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 14. ඩබ්.එම්.එම්. වසන්ති ප්‍රියදර්ශනි සමරකෝන් මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 15. එල්.ඒ.බී. චින්තිකා හර්ෂනි මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 16. ඒ.ඩී. නිශාන්ත අමරතුංග මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 17. ජේ.ඒ.ජී. විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා | - | ගරු මන්ත්‍රී |

**පිළිගැනීම**

බිබිල ප්‍රාදේශීය සභාවේ උප සභාපතිතුමා අතුළු පක්ෂ විපක්ෂ මන්ත්‍රී මණ්ඩලයෙන් හා පැමිණ සිටින සියළුම දෙනාගෙන් අවසර ලබාගත් බිබිල ප්‍රාදේශීය සභාවේ අභිනව ගරු සභාපති වී. සරත් විදානගම මැතිතුමා විසින් අභිනවයෙන් තේරී පත්වූ උප සභාපතිතුමා , පක්ෂ විපක්ෂ මන්ත්‍රී මණ්ඩලය, සභාලේකම් , ප්‍රධාන කළමනාකරණ සේවා නිළධාරි, වාර්තාකරණයේ යෙදි සිටින සහායක නිළධාරි , මාධ්‍යවේදීන් හා පැමිණ සිටින මහජනතාව යන සියළු දෙනාම මංගල මහසභාව වෙනුවෙන් ඉතාමත් ගෞරවයෙන් පිළිගන්නා ලදී. ඉතා කෙටි කාලයක් තුළ මංගල මහ සභාව රැස් කිරීමට කටයුතු කළ බැවින් කෙටි න්‍යාය පත්‍රයකට අනුව රැස්වීම මෙහෙයවන බවත් මන්ත්‍රී මණ්ඩලය සඳහා යෝජනා ලබාදීමට හැකිවන පරිදි මාසික සභා රැස්වීමක් ඉතා ඉක්මණින් කැඳවන බවත් පැවසූ ගරු සභාපති තුමා , සභාවේ සියළු දෙනාට තම ආගම සිහි කරන ලෙස දන්වා සිටින ලදී.

ආගම සිහිකිරීමෙන් අනතුරුව අදහස් දැක්වූ ගරු සභාපතිතුමා 2025 ජුනි 02 දින පෙ.ව. 11.20 ට පමණ බිබිල පළාත් පාලන ආයතනයෙහි බලය පිහිටුවීමේ කටයුතු සිදු කළ බවත් මන්ත්‍රී මණ්ඩලයේ කිහිප දෙනෙකුට ඒ සඳහා සහභාගිවීමට හැකිවූ බවත් සියළු මන්ත්‍රීවරුන්ට බලය පිහිටුවීමේ අවස්ථාව පිළිබඳ දැනුම් දීමට නොහැකි වූයේ , 2025 මැයි 31 දින මන්ත්‍රී මණ්ඩලයේ නාම ලේඛනය ගැසට් කළ බැවින් සියළු මන්ත්‍රීවරුන් දැනුවත් කිරීම සඳහා මන්ත්‍රීවරුන්ගේ දුරකථන අංක නොමැති වූ බැවින් බව දන්වා

සිටියේය. එදින ලේකම්තුමිය හා කාර්ය මණ්ඩලය විසින් ලබාදුන් තේ පැන් සංග්‍රහයට සහභාගිවී මෙන් අනතුරුව රදලියද්ද ආදාහනාගාරය, පුවක් පැලේ කසළ අංගනය හා නායකඳුර ජල පිරිපහදුව වෙත ගොස් එහි ගැටලු පිළිබඳව යම් අවබෝධයක් ලබා ගත් බවයි. සියළුම මන්ත්‍රීවරුන් සහභාගි කර ගැනීමට හැකි බැවින් ජුනි 06 දින සංග්‍රහයක් පැවැත් වීමට තීරණය කර ගත් බවත් මැතිවරණ කොමිෂන් සභාව මගින් නිකුත් කර ඇති ගැසට් පත්‍රයේ සඳහන් නම් පිළිවෙලට මන්ත්‍රී මණ්ඩලය සඳහා අසුන් පනවන ලෙස දන්වා සිටිය බවත් ඒ සඳහා මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවක් ඇත්නම් ඊළඟ සභාවාරයේදී වෙනස් කිරීමටත් සභාවේ පැවැත්ම හා පරිපාලනය සඳහා ඉතා හදිසි යෝජනා ඉදිරිපත් කරන ලෙසත් උපදෙස් දුන් බව දන්වා සිටියේය.

එම අවස්ථාවේදී නැගී සිටි එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා පැමිණ සිටින සියළු දෙනාගෙන් අවසර ලබාගත් අතර මංගල මහ සභාවට සහභාගි වීම සඳහා ලබා දුන් සංදේශය සමඟ න්‍යාය පත්‍රය ලබාදියයුතු බවත් එබැවින් මෙම න්‍යාය පත්‍රයට අනුව කටයුතු කළ නොහැකි බවත් මෙය විශේෂ සභාවක් ලෙස සලකා නැවත මාසික මහසභාවක් රැස් කර එම හදිසි යෝජනා ඉදිරිපත් කරන ලෙසත් සභාවෙහි අසුන් පැනවීම ජ්‍යේෂ්ඨතාවය අනුව සිදුකළ යුතු බවත් පවසා සිටි අතර මෙම අසුන් පැනවීමට විරෝදතාවයක් නොමති බවත් පක්ෂ විපක්ෂ වශයෙන් වෙන්ව සිටීම නිසා කරුණු සාකච්ඡා කිරීමේදී ගැටලු සහගත නොවන බවත් පවසා සිටියේය.

ගරු සභාපතිතුමා විසින් අභිනව මන්ත්‍රී මණ්ඩලයේ නියෝජිතයින් සඳහා තමා හඳුන්වාදීමට අවස්ථාව සලසා දෙන ලදී.

<u>ගරු උප සභාපති තුමා - එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා අදහස් දැක්වීම</u>

ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ 2025 පළාත් පාලන මැතිවරණය මගින් විශාල සමාජ වෙනසක් ඇති කිරීම සඳහා තම පක්ෂයට ජනතාව මනාපය ප්‍රකාශ කර ඇති බවත් තම සභිකයින්ගේ මූලික අපේක්ෂාවද එයම බවත්. රජයේ කාර්යක්ෂමතාවය, මූල්‍ය විනය, පරිපාලනය විධිමත් ආකාරයෙන් පවත්වාගෙන යමින් කටයුතු කිරීමට බලාපොරොත්තු වන අතර මහජනතාවගේ අවශ්‍යතා සපිරිය හැකි සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කළ හැකි වටපිටාවක් සහිත ප්‍රාදේශීය සභාවක් බිහි කිරීම සඳහා මැදිහත් වී කටයුතු කිරීමට සියළු දෙනාට ආරාධනා කරමින් ඒ සඳහා සියළු දෙනා හට ශක්තිය ධෛර්ය ලැබේවායි පතමින් අදහස් දැක්වීම අවසන් කරන ලදි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්. එම්. රූපසේන මැතිතුමා අදහස් දැක්වීම</u>

තමා රදලියද්ද කොට්ඨාසයෙන් පත්වූ මන්ත්‍රීවරයා බවත් ගරු සභාපති, සභා ලේකම් හා නිලධාරීන්ගේ සහයෝගයෙන් යුතුව ජනතාවගේ සමාජ, ආර්ථික, දේශපාලනික ,සංස්කෘතික ,අධ්‍යාපනික පරිවර්ථනයක් ඇති කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින බවත් තම පක්ෂය වෙත ඡන්දය ලබාදුන් සියළු දෙනා හට ස්තූති කර තම පක්ෂයත් ජනතාව ලෙස සලකා ඒ අයගේ ගැටලු විසඳීමට මැදිහත් වී කටයුතු කරමු යැයි පවසමින් සිය අදහස් දැක්වීම අවසන් කරන ලදී.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී. එම්. වීරසේකර මැතිතුමා අදහස් දැක්වීම</u>

තමා නිල්ගල කොට්ඨාසයෙන් තේරීපත්වී ඇති එකම මන්ත්‍රීවරයා බවත් ඒ සඳහා සහයෝගය ලබාදුන් ජනතාවට ස්තූතිය පලකරන බවත් සංවර්ධනය නරගයට පමණක් සීමාවී ඇති පසු බිමක නගරයෙන් ඔබ්බෙහි පිහිටා ඇති අති දුෂ්කර ඌරාවුල, කරාඩුගල , නිල්ගල, බුළුපිටිය යන ප්‍රදේශවල මාර්ග ප්‍රතිසංස්කරණය කරන ලෙස ඉල්ලා සිටිමින් සිය අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා අදහස් දැක්වීම**

පිටකුඹුර කොට්ඨාසයෙන් තමන් තේරී පත්වූ බවත් එම ප්‍රදේශයේ ප්‍රතිසංස්කරණය කළයුතු පාලම් බොක්කු බොහොමයක් ඇති බවත් ජනතාව තමා හට ඡන්දය ලබාදී ඇත්තේ බලාපොරොත්තු රැසක් පෙරදැරි කරගෙන බවත් එම බලාපොරොත්තු ඉටුකළයුතු බවත් පවසා සිටින ලදී. ලස්සන රටක් පොහොසත් ජීවිතයක් බවට පත්කිරීම සඳහා මුලින්ම ගම්බිම් දියුණු කිරීම සඳහා කැපවිය යුතු බවත් ඒ සඳහා සැමට ආරාධනා කරමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම්.ශ්‍රියානි මංගලිකා ජයලත් මැතිනිය අදහස් දැක්වීම**

ජනතාවගේ ඡන්දයෙන් මෙම සභාවේ සභිකයකු ලෙස පත්කර ඇති අප සැම එම ජනතාවගේ බලාපොරොත්තු ඉටු කිරීමට හැකියාව තම තමාට ලැබේවා යැයි තමතමන් සුභාශිංසනය කරගතයුතු බවත් විවිධ ප්‍රශ්න තාඩන පීඩන වලින් හෙම්බත් වී ඇති යුගයක ජීවත් වන ජනතාව හැරවුම් ලක්ෂ්‍ය ලෙස තමන් තෝරා පත් කර ගෙන ඇති බවත් එම නිසා ඔවුන්ගේ විශේෂ ඉල්ලීම් ප්‍රමුඛ කර ගෙන ඒවා ඉටු කිරීම සඳහා දෙපිලකට නොබෙදී නිවැරදි මගකට ගමන් කළයුතු බවත් මෙතෙක් පැවති දේශපාලන ගමන් වලට වඩා වෙනස් මගකට බිබිල ප්‍රාදේශීය සභාව ගමන් කළයුතු බවත් ජනතාවගේ බලාපොරොත්තු ඉටුකළ හැකි සභාවක් බිහිකිරීම සඳහා කටයුතු කළ යුතු බවත් පවසමින් සිය අදහස් දැක්වීම අවසන් කරන ලදි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්. එම්.එම්.අසංක වාසළ මැතිතුමා අදහස් දැක්වීම.**

මල්ලැහැව කොට්ඨාසයෙන් තේරීපත් වූ මන්ත්‍රීවරයාතමන් බවත් මෙතෙක් ජනතාවගේ බලාපොරොත්තු ඉටු නොවූ යුගයක් පැවති බවත් එම බලාපොරොත්තු ඉටු කිරීමට නව යුගයක් දැන් එළඹ ඇති බවත් පවසා සිටියේය. ජනතාවගේ බලාපොරොත්තු ඉටු කිරීම සඳහා සියළු දෙනා සහයෝගයෙන් කටයුතු කිරීමට හා බිබිල නගරය පිළිබඳ පැවති වැරදි ප්‍රතිරූපය වෙනස් කරමින් නව නගරයක් නිර්මාණය කිරීමට සියදෙනා එක්ව කටයුතු කරමු යැයි පවසමින් සිය අදහස් දැක්වීම අවසන් කරන ලදි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජයන්ති මැතිතුමිය අදහස් දක්වමින්**

තමා කුරුවාඹ කොට්ඨාසයෙන් පත්වූ මන්ත්‍රීවරිය බවත් තමා ජනතා නියෝජිතයකු ලෙස තෝරා පත් කර ගත් ජනතාවට ස්තූති කරන ලදී. ඉතා දුෂ්කර ජීවිතයක් ගත කරන බිබිලේ ජනතාවට හා ප්‍රදේශයේ දියුණුව වෙනුවෙන් එකාවන්ව එක්වී කටයුතු කරමු යැයි පවසමින් සිය අදහස් දැක්වීම අවසන් කරන ලදි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ. එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා අදහස් දැක්වීම.**

ජනතා නියෝජිතයකු ලෙස තමා තෝරා ගත් දොඩම්ගොල්ල වසමේ ජනතාවට ස්තූතිය පුදකරන බවත් මෙම ප්‍රදේශයේ ජනතාවට පොදු පහසුකම් සලසාදී සුවදායී ජීවිතයක් බවට පත් කිරීම සඳහා ජනතා සේවයේ යෙදී බිබිල ප්‍රාදේශීය සභාව අභිමානවත් ප්‍රාදේශීය සභාවක් බවට පත් කිරීමට කටයුතු කිරීමට පක්ෂ විපක්ෂ ලෙස නොබෙදී ක්‍රියා කළයුතු බවත් දොඩම්ගොල්ල ප්‍රදේශයෙන් සභාපතිවරුන් පවා බිහිවුවද මේ වනවිට දරිද්‍රතාවය, ජල, මංමාවත් ආදී විශාල ප්‍රශ්න ගණනාවකට ජනතාව මුහුණ දෙමින් සිටියි. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු පොදු මිනිසුන් බවට පත්ව මහජනතාවගේ ගැටලු විසඳමින් සියළු දෙනා එක් වී ප්‍රදේශ දියුණු කිරීමට කටයුතු කරමු යැයි පවසමින් සිය අදහස් දැක්වීම අවසන් කරන ලදි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ. එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා අදහස් දැක්වීම**

තමන් මෙතෙක් කාලයක් සම්බන්ධවී සිටි දේශපාලන පක්ෂ වලින් ප්‍රදේශයේ ජනතාවගේ උන්නතිය , සංවර්ධනය කරා ගමන් කළ නොහැකි වීම හේතුවෙන් ජාතික ජනබල වේගයට එක්වූ බවත් තම බල ප්‍රදේශයේද පාරවල් ප්‍රතිසංස්කරණය කිරීමට ඇති බවත් එම ප්‍රදේශයේ කටුමැටි ගෙවල් 32 ක් ඇති බැවින් පැවති දේශපාලන පක්ෂ ජනතාවට සලකා ඇති ආකාරය එයින් පිළිබිඹු වන බවත් ජනාධිපතිතුමාගේ සංකල්පයක් වන පොහොසත් රටක් ලස්සන ජීවිතයක් යන සංකල්පය තුළින් බිබිල ප්‍රාදේශීය සභාව මගින් ජනතාවගේ ජීවන තත්වය නගාසිටුවීමට කටයුතු කිරීමට සභාවට ඉදිරිපත් කරනු ලබන සාධනීය යෝජනා සම්මත කරමින් කටයුතු කරමු යැයි සියළු දෙනාට ආරාධනා කරමින් සිය අදහස් දැක්වීම අවසන් කරන ලදි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.ඩී.ආර්. පුෂ්පකුමාර මැතිතුමා අදහස් දැක්වීම.**

රදලියද්ද කොට්ඨාසයෙන් ඉදිරිපත් වුවද බිබිල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඇති කොට්ඨාස 10 යෙන්ම තමා තේරීපත්වී ඇති බවත්. තම පක්ෂය සඳහා ඡන්දය ලබාදුන් සියළු දෙනා හට ස්තූතිය පුදකරන බවත් ප්‍රදේශයේ දියුණුව සඳහා ගෙන එනු ලබන සාධනීය යෝජනා සඳහා සහයෝගය ලබා දෙන බවත් එමගින් බිබිල ප්‍රදේශයේ ජනතාවට සේවය කිරීමට හැකි බවත් රැස්කිරීම වෙනුවට අතහැරීම ආදර්ශයෙන් පෙන්වූ මීට පෙර සභාපතිවරුන් ලෙස සේවය කළ ඇන්ඩර්සන් සිල්වා මැතිතුමා හා අමරපාල පුංචිහේවා මැතිතුමා යන අය සිහිපත් කරමින් පුෂ්පෝපාහාර පවත්වා වත්මන් සභාපතිතුමා මෙම සභාවට පැමිණීම අගයකරන බවත් පවසමින් සිය අදහස් දැක්වීම අවසන් කරන ලදි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා අදහස් දැක්වීම**

ප්‍රථමයෙන්ම අභිනව සභාපතිතුමාට හා මන්ත්‍රී තුමන්ලා හට සුභ පතන බවත් තමා නියෝජනය කරන සමගි ජනබල වේගයෙන් පත්ව සිටින මන්ත්‍රීවරුන් 04 දෙනා වෙනුවෙන් තම පක්ෂය සඳහා ඡන්දය ලබාදුන් සියළු දෙනා හට ස්තූතිය පුදකරන බවත් පවසන ලදි. මීට පෙර පැවති සභාවල විපක්ෂයේ සිට හඬක් නැගූ මන්ත්‍රීවරයකු වූ නව සභාපති වරයා , බිබිල ප්‍රදේශය සංවර්ධනය කරතැයි විශ්වාස කරන බවත් මෙම සභාවේ සිටින මන්ත්‍රීවරුන් පක්ෂ දේශපාලනයක් නොමැති බව පැවසුවද සියළු දෙනා හට පක්ෂයක් ඇති බවත් මීට පෙර පැවති ආණ්ඩුවලින් සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කර ඇති බවත් එසේ නොකලා යැයි පැවසීම වැරදි බවත් පැවසූ අතර එම අවස්ථාවන්හිදී අක්‍රමිකතා සිදුවුවහොත් ඒ අය සඳහා නිසි දඬුවම් ලැබෙනු ඇතැයිද පැවසීය. බිබිල සතිපොළ ඉදිකිරීම, රදලියද්ද ආදාහනාගාරය ඉදිකිරීම, වීථිලාම්පු සවි කිරීම, පොදු වෙළඳපල,අතුරු මාර්ග කාපට් කිරීම ආදිය පෙර පැවති ආණ්ඩුවල සංවර්ධන යෝජනා ලෙස පෙන්වා දිය හැකි බවත් පළාත් පාලන ආයතන මගින් කළ හැකි වැඩ වපසරිය හඳුනාගෙන සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කළ බවත් මෙම සංවර්ධන කටයුතු සිදුකිරීමට ප්‍රාදේශීය සභා අරමුදලෙන් ,පළාත් සභා අරමුදලෙන් ,උසාවි දඩ හා මුද්දර ගාස්තු මගින් ප්‍රාදේශිය සභාව ආදායම් රැස්කර ගන්නා බවත් ඊට අමතරව ණය වැඩසටහන් ආදිය මගින් ආදායම රැස්කර ගන්නා බව පවසන ලදි.

2011 වර්ෂයේ සිට බිබිල ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයකුව සිටින තමා එම කාල වකවානු තුල තම මන්ත්‍රී දීමනාව හැර සතිපොළේ හෝ පොදු වෙළඳපොළේ කිසිදු කඩ කාමරයක් ලබා ගෙන නොමැති බවත් තමා කිසිඳු වංචාවක් සිදු කර නොමැති බවත් තමා එසේ නොකල නිසා ජනතාව තමාව නියෝජිතයකු ලෙස තෝරා පත් කර ගෙන ඇති බවත් සභාවට ඉදිරිපත්වන සංවර්ධනය සඳහා වූ සාධනීය යෝජනා සඳහා සහයෝගය ලබා දීමටත් එසේ නොවන අනීතික යෝජනා ඉදිරිපත්වුව හොත්

ඒවාට විරුද්ධ වී ඒවා නිවැරදි කිරීමට කටයුතු කරන බවත් බිබිල ප්‍රදේශය සංවර්ධනය සඳහා පක්ෂ භේදයකින් තොරව සහයෝගය ලබා දෙන බවත් පවසමින් සිය අදහස් දැක්වීම අවසන් කරන ලදි.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.ජී.උදය සඳරුවන් මැතිතුමා අදහස් දැක්වීම.**</u>

පිටකුඹුර කොට්ඨාසයෙන් සමගි ජනබල වේගයෙන් තමා තේරී පත්වී ඇති බවත් තම කොට්ඨාසයෙන් මන්ත්‍රීවරු තිදෙනෙක් මෙම සභාව නියෝජනය කරන බවත් ඉතා සතුටින් පවසා සිටින බවත් එසේම බල ප්‍රදේශයේ දියුණුව වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන යෝජනා සියල්ලම සම්මත කර ගැනීමට සහයෝගය ලබා දෙන බවත් නුසුදුසු යෝජනා ඉදිරිපත් නොකරනු ඇතැයි බලාපොරොත්තු වන බවත් තම ප්‍රදේශයේද මංමාවත් , ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ඇති බවද පවසමින් සිය අදහස් දැක්වීම අවසන් කරන ලදි.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - ඩබ්.එස්.එච්.වසන්ති ප්‍රියදර්ශනි සමරකෝන් මැතිතුමිය අදහස් දැක්වීම.**</u>

තමා සභිකයකු ලෙස පත් කළ වැගම කොට්ඨාසයේ ජනතාවට මුලින්ම ස්තූතිය ප්‍රකාශ කර සිටියාය. ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ ශ්‍රී මහ බෝධීන් වහන්සේ පවා ලංකාවට වැඩම කර ඇත්තේ කාන්තාවක් බවත් කාන්තාවක් වශයෙන් තමාත් ජනතා නියෝජිතයකුවීම මුළු මහත් කාන්තාවන්ටම අභිමානයක් බවත් පැවසූ මන්ත්‍රීවරිය තම ප්‍රදේශයේ කාන්තා හිංසනය,ළමා අපචාර දැක ගත හැකි බවත් ඒ වෙනුවෙන් තමා ඇප කැප වී හඬක් නගන බවත් තමාට ලැබෙන මන්ත්‍රී දීමනාව තම ප්‍රදේශයේ දුප්පත් දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් යෙදවීමට කැමති බවත් 1818 ඉංග්‍රීසීන් විසින් විනාශ කළ බිබිල ප්‍රදේශයේ අධ්‍යපනය , සනීපාරක්ෂාව ,යටිතල පහසුකම් යම්තාක් දුරට සංවර්ධනය කර ඇත්තේ පැවති පක්ෂවලින් බවත් මෙම අංශයන් නැවත ප්‍රතිසංස්කරණය කර බිබිල නගරය හරිත නගරයක් බවට පත් කිරීමට සුදුසු බවත් සභාව මගින් ගනු ලබන යහපත් තීන්දු තීරණ සඳහා සහයෝගය ලබා දෙමින් පාට පක්ෂ භේදයකින් තොරව කටයුතු කරමු යැයි පවසමින් සිය අදහස් දැක්වීම අවසන් කරන ලදි.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.ඒ.බී.චින්තිකා හර්ශනි මැතිතුමිය අදහස් දැක්වීම.**</u>

තමා කවුඩැල්ල ප්‍රදේශයේ ජනතා නියෝජිතයකු ලෙස තේරීපත්වූ බවත් තමාට සහයෝගය ලබාදුන් ජනතාවට මෙන්ම ලීල් බණ්ඩාර මැතිතුමාට විශේෂ ස්තූතියක් පුද කරන බවත් බිබිල ප්‍රදේශයේ ජනතාවගේ ගැටලු හඳුනාගෙන ජනතාවට සේවය කිරීමට අපේක්ෂා කරන බවත් බිබිල ප්‍රදේශයේ ප්‍රදේශ කිහිපයක් සංවර්ධනය වී ඇතත් තවදුරටත් සංවර්ධනය නොවූ ප්‍රදේශ හඳුනාගෙන ඒවා සංවර්ධනය කිරීමටත් ගොවිජනතාව සඳහා සහයෝගය ලබාදී ස්වයංපෝෂිත නගරයක් බිහිකිරීමට කටයුතු කරමු යැයි පවසමින් සිය අදහස් දැක්වීම අවසන් කරන ලදි.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.ඩී. නිශාන්ත අමරතුංග මැතිතුමා අදහස් දැක්වීම**</u>

තමා එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන නියෝජිතයකු බවත් තමාට මෙම ස්ථානයට පැමිණීමට සහයෝගය ලබා දුන් මහජනතාවට ස්තූතිය පුදකරන බවත් අභිනව සභාපතිතුමා මනා අවබෝධයකින් බිබිල නගරය දියුණු කරනු ඇතැයි තමා විශ්වාස කරන බවත් තමාගේ යෝජනා වලටද අවස්ථාවක් ලබා දෙන ලෙසත් තම ප්‍රදේශවල පවත්නා අඩුපාඩු සපුරාලමින් බිබිල නගරය සංවර්ධනය කරනු ඇතැයි විශ්වාස කරන බවත් යහපත් යෝජනා සඳහා සහයෝගය ලබා දෙන බවත් පවසමින් සිය අදහස් දැක්වීම අවසන් කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජේ.ඒ.ගාමිණී වර්ණකුලසූරිය මැතිතුමා අදහස් දැක්වීම.

දේශපාලන ඉතිහාසයේ අලුත් පිටුවක් පෙරලමින් සර්වජන බලය පක්ෂය බිහිවූ බවත් එම පක්ෂය තමා නියෝජනය කරන බවත් පැවති දේශපාලන ක්‍රමය වෙනස් කරමින් හයියක් නැති මිනිසුන්ට හයියක් වෙමින් හඬක් නැති මිනිසුන්ට හඬක් වෙමින් ප්‍රදේශය වැඩි දියුණු කිරීම හා ආර්ථික අර්බුධයට පිළියමක් ලබාදීම සඳහා ප්‍රතිපත්තියක් හා දැක්මක් ඇති පක්ෂයක් වන සර්වජන බලය පක්ෂය සඳහා තමා එක් වූ බවත් නොගැලපෙන සාම්ප්‍රධායික දේශපාලනයෙන් ඉවත් වී නව දේශපාලන යුගයක ගමන් කරමින් බිබිල ප්‍රාදේශීය සභාව මඟින් ගම දියුණු කරමින් මෙම සභාපතිතුමාගේ ධූරකාලය තුළ ස්වර්ණමය යුගයක් ඇති කිරීමට කටයුතු කරන ලෙසත් බහුතරයක් නොමැති පක්ෂවල නියෝජිතයින්ගේ යෝජනාවලට ද කන්දී වැඩ කරන ලෙසත් තමා හට සහයෝගය ලබාදුන් සියළු දෙනාට ස්තූතිය පුදකරමින් අභිනව මන්ත්‍රී මණ්ඩලයටද සුභපතමින් සිය අදහස් දැක්වීම අවසන් කරන ලදි.

මූලාසනයේ කථාව

ගරු මන්ත්‍රීවරු සියළුදෙනාගේ අදහස් දැක්වීම පිළිබඳව අගය කළ ගරු සභාපතිතුමා ඔවුන්ගේ එම ඉල්ලීම ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම සඳහා සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදී. එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා පැවැසූ ලෙස යම්කිසි සංවර්ධනයන් සිදු කළද මේ වන විට රට සංවර්ධනය අතින් අරාජික තත්වයට පත්ව ඇති බවත් කෙසේ වෙතත් වසම් 40ක ජනතාවගේ කැමැත්ත ජාතික ජන බල වේගයට බවත් එම ජනතාවගේ බලාපොරොත්තු ඉටු කිරීමට සියළු දෙනා එක්වී කටයුතු කළ යුතු බවත් බිබිල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙහි කොට්ඨාශ 10 යෙන් තේරීපත් වී ඇති පක්ෂ/විපක්ෂ මන්ත්‍රීවරුන් හට තම තමන්ගේ වසම් තුළ ඇති ගැටළු නිරාකරණය කර ගෙන දියුණු කිරීම සඳහා සමගියෙන් කටයුතු කරන ලෙස දන්වා සිටි ගරු සභාපතිතුමා නාගරික කේන්ද්‍රීය සංවර්ධනයයෙන් මිදි ඉන් ඔබ්බට ගිය දුෂ්කර ග්‍රාමීය ප්‍රදේශ දියුණු කිරීම ප්‍රමුඛ කර ගෙන කටයුතු කළ යුතු බව පවසන ලදි.

ඒ අනුව මාර්ග පද්ධති ප්‍රතිසංස් කරණය කිරීම නිල්ගල කොට්ඨාසයෙන් ආරම්භ කිරීමට තමා කැමති බවත් ඒ සඳහා මන්ත්‍රී මණ්ඩලයේ විරෝධතාවයක් නොමැතිවේ යැයි තමා සිතන බවත් සංවර්ධන කටයුතු සිදුකිරීම සඳහා කාර්මික නිළධාරි හිඟයක් පවතින බැවින් තවත් නිළධාරීන් දෙදෙනෙකු ගෙන්වා ගැනීමට අවශ්‍ය බවත් දන්වා සිටින ලදී.

මේ වන විට සභා ලේකම්ගේ බලතල යටතේ කළමනාකරණ කමිටුවේ නිර්දේශ හා සභා ලේකම්ගේ තීරණ මත සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක වන බවත් ඒවා තම පක්ෂයේ යෝජනා නොවන බවත් ඒ පිළිබඳව යම් පරිපාලනමය ගැටලුවක් පවතී නම් සාකච්ඡා කිරීම සඳහා සතියේ දිනවල සභාපති තුමා මුණ ගැසෙන ලෙස දන්වා සිටි අතර ප්‍රදේශයේ ආගමික උත්සව වලට හා මළ ගෙවල් සඳහා සහභාගිවන ලෙසද දන්වා සිටින ලදී.

මංගල මහ සභාව සඳහා සහභාගි වූ සියළු දෙනා හට ස්තූතිය ප්‍රකාශ කර 2025.06.24 දින පෙ.ව.9.30 ට පමණ සභා රැස්වීම් ශාලාවේදී රැස්වන බව දැනුම් දීමෙන් අනතුරුව මංගල සභාවේ කටයුතු අවසන් කරන ලදී.

වී.සරත් විදානගම,
සභාපති ,
බිබිල ප්‍රාදේශීය සභාව.,

පිටපත් -

01. ඌව පළාතේ පළාත් පාලන කොමසාරිස්, බදුල්ල. - කා.දැ.ගැ.පි.

02. පළාත් පාලන සහකාර කොමසාරිස්, මොණරාගල. - කා.දැ.ගැ.පි.

03.විගණන අධිකාරි, ජාතික විගණන උප කාර්යාලය, හුලංදාව,මොණරාගල- කා.දැ.ගැ.පි

**2 වැනි පිටුවේ දෙවන පරිච්ඡේදය සංශෝධනය -**

එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමාගේ ප්‍රකාශයෙහි මංගල මහ සභාවට සහභාගි වීමට ලබාදුන් සංදේශය යන්න ලිපිය ලෙස නිවැරදි වියයුතු බවත් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතට අනුව අසුන් පැනවීමේදී ජේෂ්ඨතාවය අනුව අසුන් පැනවිය යුතු බවත් ආණ්ඩු පක්ෂය හා විපක්ෂයේ මන්ත්‍රීවරුන් එක ළඟ සිටීම ප්‍රායෝගිකව ගැටලු සාකච්ඡා කිරීමට පහසු වන බැවින් සභාපතිතුමා විසින් අසුන් පනවා ඇති ආකාරය නිවැරදියි යැයි පැවසූ ලෙස සංශෝධනය වියයුතු බව